# කෝවිඩ් 19 සති පාසල  සබරගමුව පළාත
## නිවිතිගල අධ්‍යාපන කලාපය
## 9 ශ්‍රේණිය-ඉතිහාසය-2021-තෙවන සතිය
පස්වන සතිය (මැයි 31 සිට 6 දක්වා)

# ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය

ක්‍රියාකාරකම අංක 01- ඉන්දියාවේ යුරෝපීය බලපෑම හදුනාගනිමු

පැවරුම් අංක  01

**හැදින්වීම:-** දේශ ගවේශනයේ ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රි.ව.1498 දී පෘතුගීසි ජාතික වස්කෝ ද ගාමා ඇතුළු පිරිස ඉන්දියාවට පැමිණි අතර පසුව විවිධ කාල වකවානු තුල පෘතුගීසී, ලන්දේසී , ඉංග්‍රීසි හා ප්‍රංශ යන යුරෝපීයන් ඉන්දියාවට පැමිණ් එහි වෙරළබඩ ප්‍රදේශවල බලය තහවුරු කොටගෙන ඇත. මෙය යුරෝපීය ජාතීන් අතරින් ඉන්දියාව තුළ ස්ථාවර දේශපාලන බලයක් ගොඩනගන ලද්දේ ඉංග්‍රීසීන් විසිනි. ඉංග්‍රීසීන් විසින් විවිධ උපක්‍රම භාවිත කරමින් ඉන්දියාවේම සිය බලය පැතිරවීමට පියවර ගත් අතර එම ඉංග්‍රීසි පාලනයට විරුද්ධව 19 වන හා 20 වන සියවස්තුර ඉන්දියාව තුළ ඇතිවූ නිදහස් සටන් ව්‍යාපාරයන් පිළිබඳව මෙහිදී අධ්‍යයන කෙරේ.

- **ගුනාත්මක යෙදවුම් :-** 9 ශ්‍රේණියේ ඉතිහාසය පෙළ පොත/ඉතිහාසය සටහන් පොත්/පෑන් පැන්සල්
- **ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස්:-**
  - **පියවර 01 :-** ඉතිහාසය පෙළ පොතේ ඒකකය 04 ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය යන පාඩම ශබ්ද නගා අවස්තා 2ක් කියවන්න.
  - **පියවර 02:-** ඔබගෙ සටහන් පොත ගෙන පාඩමේ මාතෘකාව ලියන්න.
    පසුව ඉහත දක්වා ඇති හැදින්වීම එම මාතෘකාවට යටින් සටහන් කරන්න.
    පසුව පහතින් සපයා ඇති ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු සපයන්න. *[ එහිදී ප්‍රශ්නය සටහන් කර ගැනීමෙන් පසු පිළිතුරු ලිවීම අනිවාර්ය වේ]*

**ප්‍රශ්නාවලිය**

1. ඉන්දියවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතික දේශගවේශකයා කවුද? ඔහු පැමිණි වර්ෂය ලියා දක්වන්න.
2. ඉන්දියාවට පැමිණ බලය තහවුරු කරගත් යුරෝපීය ජාතිකයින් හතර අනුපිළිවෙලින් ලියන්න.
3. යුරෝපීය ජාතීන්ගේ මුල් කාලීනව පෙරදිගට පැමිණීමට හේතු වූ අරමුණු දෙක දක්වන්න.
4. ඉන්දියාව පුරා බලය තහවුරු කරගනිමින් ඉන්දියාවට සිය යටත් විජිතයක් බවට පත් කරගත් යුරෝපීය ජාතිය කුමක්ද?
5. වස්කෝ ද ගාමා ඉන්දියාවට පැමිණෙන අවදියේ පැවති කුඩා රාජධානි දෙකක් දක්වන්න.
6. ක්‍රි.ව.1509 දී පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා ලෙස පත්ව ආ පුද්ගලයා කවුරුන්ද?
7. පෘතුගීසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය ලෙස ලෙස තෝරාගත් ස්ථානය කුමක් ද?
8. පෙරදිගට පැමිණි ලන්දේසීන් මුලින්ම සිය අවදානය යොමු කලේ ආසියාවේ කුමන ප්‍රදේශයකට ද?
9. ආසියාව තුල ලන්දේසී බලය ව්‍යාප්ත කිරීමට පියවර ගත් ලන්දේසී ජාතිකයා කවුරුන්ද?
10. ඉංග්‍රීසීන්ගේ මවු රට කුමක්ද?
11. ඉංග්‍රීසීන් මුල් කාලයේ ආසියාවේ කුමන ප්‍රදේශ කෙරෙහි අවදානය යොමු කළේ ද?
12. ඉංග්‍රීසීන් ඉන්දියාවට පැමිණෙන විට එහි පැවති අධිරාජ්‍යය කුමක් ද?
13. එම අවදියේ අධිරාජ්‍යයේ පාලකයා කවුරුන්ද?
14. ක්‍රි.ව. 1613 ඉංග්‍රීසි වෙළඳ ගබඩාවක් පිහිටුවාගත් ස්ථානය කුමක්ද?
15. ක්‍රි.ව. 1613 න් පසුව ඉංග්‍රීසීන් බලය පිහිටුවා ගත් ප්‍රදේශ තුන දක්වන්න.
16. බොම්බාය දයාද වශයෙන් ඉංග්‍රීසීන්ට හිමිවීමට හේතුව දක්වන්න.
17. ප්‍රංශ පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම පිහිටවූ වර්ෂය ලියා දක්වන්න.
18. ක්‍රි.ව. 1668 ඉන්දියාවට පැමිණි ප්‍රංශවරු වෙළඳ ගබඩාවක් ඉදිකළ ස්ථානය කුමක්ද?
19. ප්‍රංශවරුන්ගේ වෙළඳ ගබඩා පිහිටුවා තිබූ ස්ථාන හතරක් ලියන්න.

**පසුවැඩ:-** 4 වන ඒකකය පදනම් කර ගනිමින් ප්‍රශන 40කින් යුත් ප්‍රෙහෙලිකාවක් නිර්මාණය කරන්න.
එය තම ඉතිහාසය විෂයභාර ගුරුභවතා වෙත ලබා දෙන්න.

සැකසුම - උදාර අරවින්ද / නිවිතිගල අධ්‍යාපන කලාපය / කළුආන ජාතික පාසල